සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන (බැංකු මහ සංගම් හා කාර්යාල) නිලධාරී සංගමය.
ALL ISLAND SAMURDHI DIWALOPMENT (BANK,MAHA SANGAM,OFFICE) OFICECES UNION
ලි.ප. අංකය 7570 නිළ වෙබ් ලිපිනය oisbku.com

අංක 68 ,
දෙහිදෙනිය
පේරාදෙනිය
2020.09.11

# 2020.09.04 දින අමාත්‍ය තුමන් සමඟ පැවති සාකච්ඡාවට අදාල කරුණු

01.දිවිනගුම පනත බලාත්මක කිරීම පිළිබඳව

දිවිනගුම පනත මගින් දිවිනගුම සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපිත කලද මේ දක්වා මෙම දෙපාර්තමේන්තුව තුල පනත ක්‍රියාත්මක නොකිරීම තුල ගැටළු රාශියක් උද්ගතව ඇති බවත් එම ගැටළු නිරාකරණය කිරීම සඳහා දිවිනගුම සංවර්ධන පනත ඉතා කඩිනමින් ක්‍රියාත්මක කිරීමට මූලිකත්වය ගතයුතු බවත් පෙන්වා දෙන ලදී.

- මේ පිළිබඳව කරුණු සොයාබලා අවශ්‍ය කටයුතු සිදුකිරීමට ගරු අමත්‍යතුමන් කටයුතු කරන බව දන්වා සිටින ලදී.

02.කළමනාකරුවන් හා සමෘද්ධි සංවර්ධන නිලධාරීන් අතර ඇතිවී තිබෙන වැටුප් විෂමතාවය පිළිබඳව.

මෙම කරුණ සම්බන්ධයෙන් අප සංගමය දීර්ඝ කාලයක සිට පාලනාධිකාරිය සමඟ සාකච්ඡා කරමින් සිටින බවත් නමුත් අද දින දක්වාම එයට

පිළිතුරක් ලබාදීමට පාලනාධිකාරිය කටයුතු නොකිරීම නිසා සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සියලු දෙනා ඉතාමත් කලකිරීමෙන් සිටින බව දන්වා සිටියා.එසේම මෙම කරුණ සඳහා පිළිතුර වශයෙන් සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සියලු දෙනා MN - 3 වැටුප් කාණ්ඩයේ පිහිටවියයුතු බවත් ඒ සඳහා කිසිදු ගැටලුකාරී තත්වයක් උද්ගත නොවන බවත් පෙන්වා දෙන ලදී.

- මෙම කරුණ සම්බන්ධයෙන් ඉතාමත් කඩිනමින් අවශ්‍ය කටයුතු සිදු කලයුතු බවත් මෙම වැටුප් විෂමතාවය ඉවත් කිරීමට සහ සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ කලකිරීම් ස්වභාවය ඉවත් කිරීම සඳහාත් ඔවුන් MN - 3 වැටුප් කාණ්ඩයේ පිහිටුවීමට අවශ්‍ය කැබිනට් පත්‍රිකාව සකස් කර ඉදිරිපත්කිරීමට කටයුතු කරන ලෙසට පාලනාධිකාරියට වගකීම් පවරන ලදී.

03.සමෘද්ධි බැංකු ,බැංකු සමිති කාර්ය මණ්ඩලය සඳහා ද්විතිය පදනම මත ලබා දියයුතු පත්වීම් කඩිනම් කිරීම.

සභාපති
එන්.ජ්.එම්.අයි.බී.අබේසිංහ
දු.අං..071-2268463

භාණ්ඩාගාරික
ආර්.ඩී.කේ.සේනාධීර
දු.අං.071- 4395535

ප්‍රධාන ලේකම්
බී.එම්.ජ්.වී.බස්නායක
දු.අං.071-8191473

අංක 68 ,

දෙහිදෙනිය

පේරාදෙනිය


2020.09.11

සමෘද්ධි බැංකු ,බැංකු සමිතිවල රාජකාරී කරනු ලබන සමස්ත කාර්ය මණ්ඩලය සඳහා සමෘද්ධි බැංකු ,බැංකු සමිතිවල සේවය කිරීමට යෙදවිය නොහැකි බවට නීතිපති තුමන් දන්වා එවා ඇති අතර ඒ සඳහා ගතයුතු සුදුසුම පියවර වශයෙන් දැනට සමෘද්ධි බැංකු ,බැංකු සමිතිවල රාජකාරී කරනු ලබන සමස්ත කාර්ය මණ්ඩලය සඳහා ද්විතිය පදනම මත සේවා ලිපි නිකුත් කොට අවශ්‍ය පහසුකම් සැපයිය යුතු බවට දන්වා ඇතත් මේ දක්වා එම ලිපි ප්‍රමාද කිරීම පිළිබඳව විමසීම් සිදු කරන ලදී.

- මෙම කරුණ සඳහා ගරු අමාත්‍ය තුමන්ගේ අදහසට පිළිතුරු දුන් අධ්‍යක්ෂ ජනරාල් තුමන් නව සේවක සංයුතිය අනුමත වූ පසු සමෘද්ධි බැංකු ,බැංකු සමිතිවල රාජකාරී කරනු ලබන සමස්ත කාර්ය මණ්ඩලය සඳහා ද්විතිය පදනම මත සේවා ලිපි නිකුත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටින ලදී.

04.2014 අන්තර්ග්‍රහණය කල නව සේවකයින්ගේ වැටුප් අඩු නොකිරීමට හා පැරණි සේවකයින් හට පොලිය රහිතව මුදල් බැදීමට අදාල කැබිනට් පත්‍රිකාව අනුමත කර ගැනීම.

සමෘද්ධි අධිකාරියේ සිට දිවිනගුම සංවර්ධන දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය කල නිලධාරීන් අතරින් නව සේවකයින්ගේ වැටුප් පරිමාව අඩු නොකිරීමටත් පැරණි සේවකයින් විසින් ගෙවිය යුතු 60% ක මුදල පොලිය රහිතව ගෙවීමටත් අවස්ථාව සලසා දීමට අවශ්‍ය කැබිනට් අනුමැතිය ලබාගැනීමට කටයුතු සිදුකර දෙන ලෙසට ඉල්ලීම් සිදුකරන ලදී.

- එම ඉල්ලීම අනුව සකස් කලයුතු කැබිනට් පත්‍රිකාව ඉතා කඩිනමින් සකස්කොට කැබිනට් අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට ගරු අමාත්‍යතුමන් විසින් අමාත්‍යංශ ලේකම් තුමන්ට බාරදුන් අතර එම ඉල්ලීම ඉටුකර දීමට එකඟතාවය පලකරන ලදී.

05.මේ වන විට නවතා ඇති ක්ෂුද්‍ර මූල්‍ය පාඨමාලා හා පරිඝනක පාඨමාලා ඇතුළු සියලු පාඨමාලා නැවත ආරම්භ කොට නිලධාරීන් ඒ සඳහා යොමුකිරීම.

ආයතනය විසින් පවත්වාගෙන ගිය සියලු පාඨමාලා නැවත ආරම්භ කිරීම සඳහා සියලු කටයුතු සිදුකර සකස් කරන ලෙසට පුහුණු අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තුමන්ට අධ්‍යක්ෂ ජනරාල් තුමන් විසින් පවරන ලදී.

06.දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ස්ථානමාරු ක්‍රියාවලිය විධිමත් කිරීම.

අංක 68 ,
දෙහිදෙනිය
පේරාදෙනිය
2020.09.11

දෙපාර්තමේන්තුව තුල ක්‍රියාත්මක කරනු ලබන ස්ථානමාරු ක්‍රියාවලිය සමෘද්ධි සංවර්ධන නිලධාරීන් හට පමණක් නොව දෙපාර්තමේන්තුගත සියලු නිලධාරී කණ්ඩායම් වලට ක්‍රියාත්මක කලයුතු බවත් එසේ නොවන්නේනම් සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ ස්ථානමාරු නොකළයුතු බවත් අපද එය ප්‍රතික්ෂේප කරන බවත් පෙන්වා දෙන ලදී.එම නිසා මෙවර සාධාරණ ස්ථානමාරු ක්‍රියාවලියක් ක්‍රියාත්මක කලයුතු බව දන්වා සිටියා.

- 2021 ට අදාල ස්ථානමාරු ලිපිකරු,කළමනාකරු,සංවර්ධන නිලධාරී යන සියලුම කණ්ඩායම් සඳහා ක්‍රියාත්මක කරන බව අධ්‍යක්ෂ ජනරාල් තුමන් විසින් ප්‍රකාශ කළා.එයට ගරු අමාත්‍යතුමන්ගේද එකඟත්වය පල කරන ලදී.

07.ජීවනෝපාය ව්‍යාපෘති යටතේ ප්‍රතිලාභීන්ගේ නිෂ්පාදන ක්‍රියාවලියට අදාල දේශීය අමුද්‍රව්‍ය අනෙකුත් රාජ්‍ය ආයතන යටතේ ඇති ආයතන වලින් සහනදායී පදනම මත ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

සමෘද්ධි ප්‍රතිලාභීන් විසින් මේවන විට සිදුකරගෙන යනු ලබන කර්මාන්ත වෙනුවෙන් අවශ්‍ය අමුද්‍රව්‍ය සහනදායී මිල පදනම යටතේ අනෙකුත් රාජ්‍ය ආයතන වලින් ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳව දෙපාර්තමේන්තුව මැදිහත්ව එම ආයතන අපගේ කර්මාන්ත කරුවන්ට සම්බන්ධ කරමින් ඔවුන්ට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීමට අවස්ථාව සැලසීමට පියවර ගතයුතු බව පෙන්වාදෙන ලදී.

- මේ සඳහා ගරු ඇමතිතුමන් මැදිහත්වන බවත් අපගේ ජීවනෝපාය සංවර්ධන අංශයට මෙහි වගකීම භාරදියයුතු බවත් ඉදිරියේදී මේ පිළිබඳව විධිමත් සමීක්ෂණයක් සිදු කොට අවශ්‍ය කටයුතු කිරීමට එකඟ විය.

08.නිෂ්පාදන අලෙවිකිරීමෙදී දේශීය හා විදේශීය වෙළඳපල ඉලක්ක කරගත් අවශ්‍ය නිෂ්පාදන දිරිගැන්වීම.

දේශීය වෙළඳපොලට මෙන්ම විදේශීය වෙළඳපොලට ගැලපෙන ආකාරයේ නිෂ්පාදන වැඩිදියුණු කිරීමට අවශ්‍ය මඟපෙන්වීම් අප දෙපාර්තමේන්තුව විසින් සිදුකලයුතු බවත් හැකි සෑම අවස්ථාවකදීම වෙළඳපොළ අපගේ නිෂ්පාදකයාට සම්බන්ධ කිරීමට කටයුතු කිරීම සඳහා ක්‍රමෝපායන් සැකසිය යුතු බවත් පෙන්වාදෙනු ලැබුවා.

- මේ පිළිබඳව සොයාබලා අවශ්‍ය කටයුතු කිරීමටත් අනෙක් දෙපාර්තමේන්තු සමඟ සාකච්ඡා කර අවශ්‍ය කටයුතු කිරීමට ගරු අමාත්‍යතුමන් එකඟතාවය පලකළා.

සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන (බැංකු මහ සංගම් හා කාර්යාල) නිලධාරී සංගමය.
ALL ISLAND SAMURDHI DIWALOPMENT (BANK,MAHA SANGAM,OFFICE) OFICECES UNION
ලි.ප. අංකය 7570 නිළ වෙබ් ලිපිනය oisbku.com

අංක 68 ,
දෙහිදෙනිය
පේරාදෙනිය
2020.09.11

09.සමෘද්ධි ප්‍රතිලාභීන් සවිබල ගැන්වීම පිළිබඳව.

සමෘද්ධි සහනාධාර ලාභීන් සඳහා සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කරමින් ඔවුන්ගේ ජීවනතත්වය උසස් කරලීමට කටයුතු කර ක්‍රමානුකූලව සමෘද්ධි සහනාධාරය ඉවත් කලයුතු බවත් සමෘද්ධි නිවාස ලොතරැයි සමාජ ආරක්ෂණ ප්‍රතිලාබ ලැබෙන පරිදි සුදුසු ක්‍රමවේදයක් සකස් කොට බැංකු වැඩසටහන තුල රැදී සිටීමට අවස්ථාව සකස් කර දියයුතු බවත් එසේ නොකර සහනාධාර ලාභීන් සවිබල ගැන්වීමට යොමුකර ඇති චක්‍රලේකනය කාලෝචිත නොවන බවත් පෙන්වා දුන්නා.

- අපගේ සමෘද්ධි ලාභීන් මේ වනවිට තම ආර්ථික වර්ධනය ඇතිකරගෙන සිටින අය සහ ඉතාමත් ශක්තිමත් ව්‍යාපෘති සිදුකරගෙන යනු ලබන අයවලුන් සිටින බවත් ඔවුන්ද මෙම වැඩසටහන රඳවා ගනිමින් ඔවුන්ගේ සහනාධාරය ඉවත් කලයුතු බවත් එයට සුදුසු වැඩපිළිවෙලක් කඩිනමින් සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව අධ්‍යක්ෂ ජනරාල් තුමන් විසින් ප්‍රකාශ කලා.

10.ඉතා කඩිනමින් බැංකු පද්ධතිය පරිඝනකගත කිරීම පිළිබඳව.

බැංකු පද්ධතිය මේවන විට පරිඝනකගත කිරීම ආරම්භ කර ඇති අතර එය කඩිනම් කිරීම සඳහාත් බැංකු පද්ධතිය පරිඝනකගත කිරීමෙන් පසු එය ක්‍රියාත්මක කරගෙන යාමේදී සිදුවන වැරදි නිවැරදි කිරීම් ආදී කටයුතු සිදුකිරීම සඳහා වෙනම ඒකකයක් ස්ථාපිත කොට පවත්වාගෙන යායුතු බව පෙන්වා දුන්නා.

- මේ වන විට බැංකු පද්ධතිය පරිඝනකගත කිරීමේ කටයුතු මූලික අදියරේ පවතින බවත් ඉදිරියදී මේ සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීමටත් ඒ සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට උපදෙස් ලබාදීමට ඉදිරියේදී කටයුතු කරන බවටත් අධ්‍යක්ෂ ජනරාල් තුමන් විසින් ප්‍රකාශ කලා.

11. 2017 වර්ෂයේ බඳවාගත් සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය පැවැත්වීම පිළිබඳව සාකච්ඡා කළා.

- එම විභාගය 2020 දෙසැම්බර් අවසන් වීමට ප්‍රථම පැවැත්වීමට අවශ්‍ය කටයත කරන බව අධ්‍යක්ෂ ජනරාල් තුමන් විසින් ප්‍රකාශ කළා.

| සභාපති | භාණ්ඩාගාරික | ප්‍රධාන ලේකම් |
| --- | --- | --- |
| එන්.ජ්.එම්.අයි.බී.අබේසිංහ | ආර්.ඩී.කේ.සේනාධීර | බී.එම්.ජ්.වී.බස්නායක |
| දු.අං..071-2268463 | දු.අං.071- 4395535 | දු.අං.071-8191473 |